**නල්ලූර් ප්‍රාදේශීය සභාව - 2021**
**----------------------------------**

**1 මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**
**--------------------------**

නල්ලූර් ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට නල්ලූර් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**----------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**
**----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**
**------------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

-

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ සභාව විසින් වැඩ ක්‍රියාත්මක කර නොතිබූ වැඩ 40ක් සඳහා ගෙවීම් වවුචර් පිළියෙල කර විවිධ ණය හිමියන් යටතේ ගණුම් ගත කර තිබීමෙන් රු. 79,369,991 ක් වටිනාකමින් ජංගම වගකීම් වැඩියෙන්ද අතිරික්තය අඩුවෙන්ද දක්වා තිබුණි. | සභාවේ ව්‍යාපෘති කෝවිඩ් - 19 හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීමෙන් බලාපොරොත්තු වූ ආදායම් අහිමිවූ අතර, මානව සම්පත් හිඟවීම, වර්ෂ අවසානයේ ටෙන්ඩර් කැඳවීම යන හේතු නිසා විවිධ ණය හිමියන් යටතේ වෙන්කරන ලදි. ඉදිරියේදි ඔබගේ උපදෙස් අනුව ක්‍රියා කරනු ලැබේ. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | දේශීය ණය සංවර්ධන අරමුදලට 2022 වර්ෂයේ ගෙවිය යුතු රු. 1,228,438 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් යටතේ දැක්විය යුතු වූවත් ණය ප්‍රාග්ධන යටතේ දක්වා තිබීමෙන් ණය ප්‍රාග්ධනය එම වටිනාකමින් වැඩියෙන්ද ජංගම වගකීම් අඩුවෙන්ද දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ණය ප්‍රාග්ධන යටතේ (සටහන් අංක 13) අතපසුවීමකින් 2020 ආරම්භක ශේෂය ලෙස දක්වා තිබුණි. ඉදිරියේදි මෙවැනි වැරදි සිදු නොවීමට වග බලාගන්නා බව දන්වා සිටිමි. | |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිණුම් ශේෂ තුනක සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය සහ ඉකුත් වර්ෂ අවසානයට විගණනය කළ ශේෂය අතර රු. 1,590,021 ක වෙනසක් නිරීක්ෂණ විය. | වැරදීමකින් මෙම ශේෂය වෙනස් වී ඇත. ඉදිරි මූල්‍ය ප්‍රකාශනයේ නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම් ශේෂ සහ අනෙකුත් ලේඛන සැසඳිය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති ණය ප්‍රාග්ධනය ශේෂය සහ ශේෂ පත්‍ර සටහන් 13 හි දක්වා තිබු ශේෂය අතර රු. 1,028,129 ක වෙනසක් විය. | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ ණය ප්‍රාග්ධනය (සටහන් අංක 13) 2020 වර්ෂයේ ආරම්භක ශේෂයේ දක්වා තිබුණි. ඉදිරියේදි මෙවැනි වැරදි සිදු නොවීමට වග බලාගන්නා බව දන්වා සිටිමි. | |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදල යටතේ ආධාර වෙන්කිරීම. | 20,269,673 | සභා තීරණ | ආධාර ගිණුම්ගත කර තිබූ මුදල රු. 20,269,673 ක මුදල වත්කම්වල ක්ෂවීම් නිරවුල් කිරීම සඳහා ස්ථාවර තැන්පත්වල දක්වා ඇත. | වෙන්කිරීම් සිදුකිරීම සඳහා සභා තීරණ ගත යුතුය. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 164,717,484 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.105,363,368 ක් විය.

**2.2 ආදායම් පරිපාලන**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **වරිපනම්**<br>නල්ලූර් ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ තිබෙන ඉඩම් සහ ඉදිකරන ලද නිවාස සහ ගොඩනැගිලිවලින් ඉකුත් වර්ෂ 02 ක සිට අයකළ යුතු රු. 13,195,388 ක් වටිනා වරිපනම් බදු අයකර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂයේ බිල්කල වරිපනම් බදු ආදායම් රු. 29,764,219 ක් වුවද, ඉන් රු. 12,763,950 ක් අයකරගෙන නොතිබුණි. | රතු නිවේදන නිකුත්කර හිඟ වරිපනම් අයකිරීමට කටයුතු කර ඇත. 2021 වර්ෂයේ ජංගම සේවය පැවැත්වීමට නොහැකිවීමෙන් හිඟ වරිපනම් අයවීම් අඩු මට්ටමක පැවතුනි.<br>2022 වර්ෂයේ අයවැයෙන් මෙම කරුණු වළක්වා නියමිත වටිනාකම මාරු කර ඇත. මෙවැනි වැරදි ඉදිරියේදි නොවීමට කටයුතු කළ ඇත. | හිඟ වරිපනම් බදු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ) උසාවි දඩ මුදල සහ මුද්දර ගාස්තු**<br>පළාත් සභා ප්‍රධාන ලේකම්ගෙන් සහ අනෙකුත් නිලධාරීන්ගෙන් 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ මුදල රු. 445,011 ක් සහ වර්ෂ 05 කට වැඩි කාලයක සිට අයවිය යුතු රු. 3,875,162 ද සමාලෝචිත වර්ෂයට අදාල රු. 822,294 ක හිඟ මුද්දර ගාස්තුද අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | උසාවි දඩ මුදල වශයෙන් අයවිය යුතු රු. 3,875,162 වර්ෂ 05 කට වඩා වැඩි කාලයක් හිඟව තිබූ මුද්දර ගාස්තු රු. 2,894,342 ක් විය. රු. 980,820 ක මුදල කපා හැරීමට ගරු. ආණ්ඩුකාරවරයාගෙන් අනුමැතිය සඳහා යවා ඇත. | මුදල් කඩිනමින් ගෙන්වා ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම් සහ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයක් නිරීක්ෂණය විය. | Covid – 19 වසංගතය සහ අධික වර්ෂාව හේතුවෙන් වැඩ ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | ව්‍යාපෘති අදාල කාලයතුල ආරම්භකර නිම කරන බව සහතික විය යුතුය. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 134 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ සත්‍ය සේවක සංඛ්‍යාව 123 ක්වූ බැවින් පුරප්පාඩු 11 ක් පැවතිනි. | පිළිතුරු එවා නොතිබුණි. | සේවක සංඛ්‍යා පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. |